

# කතෘගෙන්

උසස් නිෂ්පාදනයක් සඳහා ගොවීන්ට උවමනා ද්‍රව්‍ය සියල්ල ඔවුන්ට හැකිතාක් පහසුවට ලබා ගත හැකි අයුරු සලසා තැබීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෑතදී ගන්නා ලද පියවරයන් කෘෂිකර්ම ව්‍යාප්ති කටයුතුවල බෙහෙවින් වැදගත් ප්‍රතිසංවිධානයන් ලෙස සැලකීමට පිළිවන.

අප රටේ ගොවීන්ගෙන් වැඩි දෙනෙකු මෙවකට දියුණු ගොවිතැන් ක්‍රම අනුගමනය කිරීමේ වැදගත්කම හා ඒවායින් ලැබෙන ඵල ප්‍රයෝජනයද හොඳා කාරවදනී. උසස් පෙළේ තෝරන ලද බීජ පාවිච්චිය, නිරෝගී හොඳ වර්ගවල මනා ලෙස වැඩුණු පැළෑටි සිටුවීම, දියුණු ගොවිතැන් ක්‍රම අනුගමනය කිරීම කාර්යක්ෂම, නවීන හා දියුණු කළ ගොවි උපකරණ හා වෙනත් ගොවි යන්ත්‍රෝප කරණ භාවිතය පමණක් නොව කෘමි නාශක, රෝග නාශක හා වල් පැළෑටි නාශක බෙහෙත් වැනි කෘෂි-රසායන ද්‍රව්‍යයන් ගොයමට යෙදීම යනාදිය අද දවස ග්‍රාමීය ගොවීන් බොහෝ දුරට සිදු කරන දේ වෙත්. ඒ අතර කොළ පෝර, ගොම පෝර හා කොම්පොස්ට් පෝර වැනි ඉන්ද්‍රියවත් ද්‍රව්‍ය සාමාන්‍ය වශයෙන් සහ නයිට්‍රජන්, ෆොස්ෆොරික් අම්ලය හා පොටෑෂ් අඩංගු රසායන පෝර ද්‍රව්‍ය විශේෂ වශයෙන් ද පාවිච්චිය කෙරෙහි ලක් ගොවියා වැඩිවී යන උනන්දුවක් දක්වයි. දියුණු ගොවිතැන් ක්‍රම අනුගමනය කිරීමේ මැලිකමක් දක්වන බොහෝ ගොවීහු පවා මෙකල එසේ කරන්නේ වෙනත් කරුණු හේතුකොට ගෙන ය.


2*—ආර් 17416 (64/4)

ගොවිතැනේ යහපත් ක්‍රමයන් බොහෝ දුරට දන්නා ගොවියා හට දැනට වුවමනා කරන්නේ සේවා පහසුකම් ය. එම සේවා පහසුකම් වඩා හිරිහැර නොවී ලබා ගත හැකි විට දියුණු ගොවිතැන් ක්‍රමවල ප්‍රයෝජන නොදත් ගොවියා මෙන් ඒ ගැන උදසීන ගොවියාද මෙම යහපත් ක්‍රමවලට නිරායාසයෙන්ම හැරී යනවාට අඩමානයක් නැත. එබැවින් දියුණු කළ ඇට වර්ග, තෝරා බෝකල පැළැටි, කෘමිනාශක බෙහෙත්, දිලීර නාශකයන්, වල් පැළැටි නාශක ද්‍රව්‍යයන්, බෙහෙත් ඉසීමේ යන්ත්‍ර, වල් නෙලීමේ යන්ත්‍ර යනාදී ගොවිතැනට වුවමනා දේ ගොවිකම් ව්‍යාප්ති මධ්‍යස්ථානවල විකිණීම පිණිස තැබීම ගොවි ජනතාවට විශාල ප්‍රයෝජනයකි. එය ගොවිකම් ව්‍යාප්ති සේවයේ විශේෂ ප්‍රගමනයක් ය.

කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානයන්ගෙන් සැලසෙන මෙම නව සේවා පහසුකම් වල ප්‍රයෝජනත්වය වඩාත් උසස් වන පරිදි ඒවායේ පිහිටීම අවශ්‍යානම් වෙනස් කිරීමටද කටයුතු සලස්වා තිබීම තවද වටිනා පියවරකි. එසේ කළ විට ගොවියාට ලැබෙන මෙම නව පහසුකම් වැඩි දෙනෙකුට ප්‍රයෝජන ගත හැකි අයුරු සැල සෙනවා ඇත.

ඒ අතර ගම්බද පොළවල්වලට හා කඩමන්ඩිවලට ගොවීන්ට වුවමනා මෙවැනි ද්‍රව්‍ය ගෙන ගොස් විකිණීම, දැනට සැලකිය යුතු කාලයක සිට ඉටුවන ඉතා වැදගත් සේවයකි.

ගම්බද ගොවියාගේ ඕනෑකම් ලබා දෙන අන්දමට දිවයිනේ ඇති සියළුම ගොවිකම් ව්‍යාප්ති මධ්‍යස්ථාන හැඩ ගැස්වී තිබීම හා ගොවියාගේ අවශ්‍යතාවයන් සැපයීම සඳහා ව්‍යාප්ති සේවකයා ඔහු කරා යැවීමද ගොවිකම් ව්‍යාප්ති කටයුතු ප්‍රතිසංවිධානයේ ඉතා වැදගත් අංශයන් බැවින් අප ගොවියා එම පහසුකම්වලින් ප්‍රයෝජන ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගනී යයි අපි බලාපොරොත්තු වෙමු.